**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2021**

**------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

## 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 106 හා 108 ඡේද ප්‍රකාරව ස්කන්ධයේ සියළුම සංරචක ඇතුළත් වන පරිදි ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන රු.5,920,019 ක් හා ප්‍රාග්ධන ලාභ රු.64,275,375 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.35,614,587 කින් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.34,533,678 කින් වැඩියෙන්ද, 2021 ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.951,159 කින් වැඩියෙන්ද හා 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.129,750 කින් වැඩියෙන්ද දැක්වුණි. | - එම- | - එම- |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 36 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ප්‍රවර්තන වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ගැලපිය යුතු | - එම- | - එම- |

| | | | |
|---|---|---|---|
| | වුවද, රු.108,000 ක විගණන ගාස්තු අධි වෙන් කිරීම හා රු.270,777 ක එකතු කළ අගය මත බදු ඌන වෙන් කිරීම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ රඳවා ගත් ලාභයට ගලපා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 81 (ඇ) ඡේදය ප්‍රකාරව, පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදවලට සාපේක්ෂව අදාළ බදු අනුපාතයන්හි වෙනස්කම් පිළිබඳ පැහැදිලි කිරීමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද, අධිකාරිය විසින් පෙර වර්ෂවල අදාළ කර ගත් සියයට 28 ක බදු අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 14 දක්වා වෙනස් කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | - එම- | - එම- |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 61 ඡේදය ප්‍රකාරව, දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවද, එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වූ පිරිවැය රු.7,233,052 ක් වූ වත්කම් අයිතම 187 ක් තව දුරටත් භාවිතා කරමින් පැවතුණු අතර මෙම ප්‍රමිතියේ 76 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි. | - එම- | - එම- |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය පිහිටි කාර්යාල ගොඩනැගිල්ල, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාර ගොඩනැගිල්ල හා එම ඉඩම් සහ වාහන 06 ක් අධිකාරිය වෙත පවරාගැනීමට, තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර අධිකාරිය වෙත පවරාගෙන තිබුණු වාහන 03 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයෙන් ඉල්ලුම් කළ නමුත් මෙ දක්වා පිළිතුරු ලැබී නොමැති බව හා හැකි ඉක්මනින් වාහන තක්සේරු කර ගිණුම්ගත කරන බව. | අධිකාරිය පාවිච්චි කරන නමුත් අයිතිය පවරා ගෙන නැති සියළු වත්කම් පවරා ගෙන හා අධිකාරිය සතු නමුත් ගිණුම් ගත කර නැති සියළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ආදායම් බදු ගණනය කිරීමේදී, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 වගන්තිය ප්‍රකාරව පනතේ 04 වන උපලේඛනය මගින් ප්‍රාග්ධන දීමනාව ප්‍රදානය | ආදායම් බදු වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය | ආදායම් බදු ගණනය කිරීමේදී පැරණි හා නව බදු සංශෝධනයන් |

| | | | |
|---|---|---|---|
| | කරනු ලබන වර්ෂ ගණන සංශෝධනය කර තිබීම හා 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 51(2)(4)(ඌ) වගන්තිය ප්‍රකාරව 2020 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සෞඛ්‍ය රැකවරණ සේවා සැපයීමෙන් ලබන ලැබීම් හා ලාභ මත පනවනු ලබන බද්ද සියයට 14 දක්වා අඩුකර තිබීම පිළිබඳව සැලකිලිමත් නොවීම, 2020 වර්ෂයේ විලම්බිත බදු වියදම ගණනය කිරීමේදී ආරම්භක ශේෂය වැරදි ලෙස යොදා ගෙන තිබීම හා ගිණුම්කරණ දෝෂ සහිතව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන දීමනාව වැරදි ලෙස ගණනය කර තිබීම යන කරුණු හේතුවෙන් වත්මන් ආදායම් බදු වියදම (Current Income Tax) රු.124,779,725 ක්ද, විලම්බිත ආදායම් බදු වියදම (Differed Income Tax) රු.13,359,739 ක්ද වශයෙන් මුළු ආදායම් බදු වියදම රු.138,139,464 ක් වැඩියෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද රු.124,779,725 ක්ද, ජංගම නොවන වගකීම් යටතේ විලම්බිත ආදායම් බද්ද රු.10,413,183 ක්ද වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නිවැරදි ආදායම් බද්ද රු.27,056,510 ක් වුවද, අධිකාරිය විසින් 2022 ජුනි 16 දින රු.151,836,233 ක් ආදායම් බදු වශයෙන් ගෙවා තිබීම හේතුවෙන් රු.124,779,723 ක් ආදායම් බදු ලෙස වැඩියෙන් ගෙවා තිබුණි. | කටයුතු සිදු කරන බව. | පිළිබඳ අවධානය යොමු කර ගණනය කිරීම් සිදු කළ යුතුය. |
| (ඇ) | අධිකාරිය වෙත 2019, 2020 හා 2021 වර්ෂවලදී ලැබී තිබුණු ආදායම්වලින් නැවත ගෙවීම සඳහා අනුමත කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණු රු.692,031 ක් එදිනට ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන බව. | ගිණුම් කාලච්ඡේදයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | අධිකාරිය විසින් පවත්වා තිබුණු එළිමහන් පුහුණු වැඩසටහනට අදාළ රු.527,065 ක වියදම පුහුණු කිරීම් හා සංවර්ධන වියදම් (Training and Development) ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ඉන් රු.65,025 ක් වෙනත් වියදම් යටතේද, රු.45,290 ක් දේශීය ගමන් වියදම් යටතේද ගිණුම්ගත කර තිබුණි. තවද සමරු තිළිණ සඳහා ගෙවිය යුතු රු.138,250 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වියදම් ගිණුම්ගත කිරීමේදී සිදුවී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් එකඟ වන බව | - එම- |

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලැබීම් ගිණුමේ රු.72,972,666 ක්වූ ශේෂය. | අදාළ උපලේඛන හා ලැබීම් විස්තර | මේ සම්බන්ධයෙන් පිළියෙල කළ වාර්තාවක් විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ බව හා මෙම අගය කපා හැරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | අදාළ උපලේඛන හා ලැබීම් විස්තර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත | | | |
| (i) 58, 59, 82 , 83 හා 109 වගන්ති | යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර හා අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට අධිකාරිය වෙත බලය ලැබී තිබුණි. නමුත් එවැනි තත්ත්වයන් යටතට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම වැනි හේතු මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා පෞද්ගලික ආයතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ඖෂධ වෙනුවෙන් 67 ක්ද වෛද්‍ය උපකරණ වෙනුවෙන් 140 ක්ද නිකුත් කර තිබුණි. | නිරීක්ෂණය සමග එකඟ නොවන බව, ජීවිතයක් බේරා ගැනීම සඳහා හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීම වැනි විශේෂ අවස්ථාවලදී, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම, ඖෂධ ආනයනය නොකිරීම හා ලියාපදිංචිය ලබා ගැනීමේ ප්‍රවණතාව අඩුවීම වැනි කරුණු හේතුවෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ඖෂධ හිඟවීම නිසා රට තුළ ඖෂධය සම්බන්ධයෙන් අර්බුදකාරී තත්ත්වයන් නිර්මාණයවීම වැනි විශේෂ අවස්ථානුගත කරුණුවලදී සෞඛ්‍ය අමාත්‍යාංශ අනුමැතිය මත පනතේ 109 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇති බව. | පනතේ සඳහන් විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට කටයුතු කිරීම තුළින් තත්ත්වය පිළිබඳ සහතිකයක් නොමැති ඖෂධ රට තුළට ඇතුල්වීම අවම කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 60 (2), 61, 84(2), 85, 103(2) හා 104 වගන්ති හා උප වගන්ති | අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම මෙන්ම ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථාද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් නිකුත් කර තිබුණු ඖෂධ ලියාපදිංචි සහතික 2,948 ක් හා ප්‍රතික්ෂේප කර තිබුණු අයදුම්පත් 991 ක්ද, වෛද්‍ය උපකරණ ලියාපදිංචි සහතික 315 ක් හා ප්‍රතික්ෂේප කර තිබුණු අයදුම්පත් 23 ක්ද, ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට අධිකාරියේ වෙබ් පිටුවේ පළ කර තිබුණි. | ලියාපදිංචි වූ හෝ ප්‍රතික්ෂේප කරන ලද ලැයිස්තු කලින් කලට ගැසට් පත්‍රයේ පලකරනු ලැබීම ප්‍රායෝගිකව ගැටලුකාරී වන බව හා ඒ හේතුවෙන් එම අවශ්‍යතාවය ඉටු වන අකාරයට පනත සංශෝධනය කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 69(1)(අ)(i) උපවගන්තිය | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ සභාපති වශයෙන් වෛද්‍ය උපකරණ නියාමන අංශයේ ප්‍රධානියා කටයුතු කළ යුතු වුවද, වෛද්‍ය උපකරණ නියාමන අංශයේ ප්‍රධානී තනතුරට නිලධාරියෙකු පත් කර නොතිබීම හේතුවෙන් අධිකාරයේ සභාපති හෝ ප්‍රධාන විධායක නිලධාරී විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ සභාපති ධූරය හොබවා තිබුණි. | නියාමන අංශ සඳහා පත්කළ වැඩබලන අංශ ප්‍රධානීන් (Focal Point) වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරන බව. | අදාළ අංශ ප්‍රධානීන් විධිමත් ලෙස පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | 142 වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග අංක 4, 133 (5) හා නියෝග අංක 134 හි XXIII වන උපලේඛනයේ | ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම ලේඛනගත කිරීමට එක් පොදු ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ලද දිනය, ඉල්ලුම් පත්‍රයේ අංකය, නිෂ්පාදකයාගේ නම, නිෂ්පාදිත රට, බලය ලත් ආනයනකරු, ඖෂධීය නාමය, එම ඖෂධය ඖෂධීය සංයෝගයක් නම් එහි සක්‍රීය සංඝටකවල ඖෂධීය නාමයන්, ඖෂධයේ වෙළඳනාමය, ඖෂධයේ මාත්‍රා ආකාරය, ඖෂධයේ ප්‍රබලතාවය, අයදුම්පත නව හෝ අළුත් කිරීමක් සඳහා වන අයදුම්පතක්ද යන බව, ඖෂධයේ වර්ගය ආදී වූ විස්තර මෙන්ම ඒ ඒ අයදුම්පත වෙනුවෙන් ලද මුදල් පිළිබඳ විස්තර, ඒ ඒ අයදුම්පත ඖෂධ නියාමන අංශය වෙත ඇගයීම සඳහා ඉදිරිපත් කළ දිනය, ඒ ඒ අංශ විසින් ප්‍රතික්ෂේපිත අයදුම්පත් ප්‍රමාණය හා අනුමත කළ අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශවල තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශ විසින් ලියාපදිංචියට ගත කළ කාලය ආදී වූ තොරතුරු විගණනය සඳහා ලබාගත | මෙම තොරතුරු ඒ ඒ අංශ වෙතින් ලබා ගත හැකි බව, 2021 නොවැම්බර් මස සිට සියළු තොරතුරු ආවරණය වන පරිදි google sheet පවත්වාගෙන යන බව හා එම දත්ත විශ්ලේෂණය කිරීමෙන් ප්‍රගතිය ලබාගත හැකි බව. | නියෝගය ප්‍රකාරව දත්ත පද්ධතිය නිසි ලෙස පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 08 ඡේදය | නොහැකි විය. ඒ හේතුවෙන් ඉලක්කගත සැකසුම් කාලසීමාව තුළ ලියාපදිංචි සහතික නිකුත් කරන බව තහවුරු කරගැනීමට නොහැකි විය. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2021 නොවැම්බර් මස සිට සියළු තොරතුරු ආවරණය වන පරිදි google sheet පවත්වාගෙන යන බවට සභාපති විසින් අදහස් ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 අගෝස්තු 31 දින දක්වාම එම google sheet වෙත පිවිසීම සඳහා අවශ්‍ය මුරපද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | | |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර අනුමතවී ඇති බව, ඊට අදාළ බඳවා ගැනීමේ පරිපාටි පිළියෙල කර, පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා දින නියම කර ඇති බව. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 4.1 හා 10.1 ඡේද | සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දින රාජකාරිවල නිරතවීම වෙනුවෙන් 1/20 දීමනාව හිමි මාණ්ඩලික නිලධාරියකුට අතිකාල දීමනා ලබාගැනීමට හිමිකමක් නොමැති වුවද, අධිකාරියේ සේවය කරන විධායක නිලධාරියෙකු ඇතුලු මාණ්ඩලික නිලධාරීන් 26 දෙනකු වෙත නිවාඩු දින 998 ක් වෙනුවෙන් රු.2,060,455 ක් හා අතිකාල පැය 8,520 ක් වෙනුවෙන් රු.1,977,619 ක් ලෙස 1/20 දීමනාව හා අතිකාල දීමනා යන දීමනා දෙකම ගෙවා තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා ගත් අනුමැතිය පදනම් කර ගනිමින් මෙම දීමනා ගෙවා ඇති බව. | වැඩිපුර ගෙවූ දීමනා ආපසු අය කිරීමට හෝ ආයතන සංග්‍රහයේ විධි විධානවලට පටහැනි වන අවස්ථාවලදී ඒ සඳහා ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 237 (ආ) | භාණ්ඩ ලැබී ඇති බවටද, අදාළ බඩු ලේඛන හෝ තොග පොත්වලට ඇතුළත් කර ඇති බවටද සහතිකයක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08 කදී රු.578,958 ක ගෙවීම් වවුචර් සහතික කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2) (ආ) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් උපරිමය රු.100,000 ක තත්කාර්ය අත්තිකාරම් නිකුත් කළ හැකි වුවද, මාණ්ඩලික නොවන නිලධාරීන් 08 දෙනෙකු වෙත අවස්ථා 17 කදී රු.1,794,000 ක් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද නිකුත් කළ අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් නිකුත් කර තිබුණු අවස්ථාද විය. | 2022 වර්ෂයේ සිට අත්තිකාරම් නිකුත් කිරීම විධිමත් කර ඇති බව. | මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 128(1)(ඉ), 507, 756, 757, 758, 770 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදය | ගණන්දීමේ නිලධාරී විසින් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට හා එහි වාර්තා ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවද, අධිකාරිය පිහිටවූ 2015 වර්ෂයේ සිටම මුළු පිරිවැය රු.114,561,686 ක්වූ ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධ කටයුතු කඩිනමින් අවසන් කර අදාළ වාර්තා ඉදිරිපත් කරන බව. | -එම- |
| (iv) | මුදල් රෙගුලාසි 1645 (අ) හා 1647(ඉ) | වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් 267 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර විධිමත් ලෙස වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. එසේම වාහන භාර නිලධාරී විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. | වාහන සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක් හා ලොග් සටහන් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලසා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ
--------------

| | | | |
|---|---|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මුළු පිරිවැය රු.114,561,686 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කර ගැනීම් සිදු කරන බව. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම ආයතනයක් විසින්ම සුදුසු නිලධාරියකු නම් කළ යුතු වුවද, අධිකාරිය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කර ගැනීම් සිදු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ
-------------------

| | | | |
|---|---|---|---|
| (i) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ් 19 දිරි දීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සාමාන්‍ය රාජකාරි දින හා නිවාඩු දිනයන් ලෙස නොසලකා රාජකාරියට වාර්තා කරන දිනකට දින 1 ½ බැගින් දීමනා ගණනය කර ඉකුත් වර්ෂයේදී රු.17,843,781 ක්ද, සමාලෝචිත වර්ෂයේදී රු.44,273,092 ක්ද වශයෙන් රු.62,116,873 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | මේ වන විට මෙම ගෙවීම් අත්හිටුවා ඇති බව. | ගෙවූ දීමනා ආපසු අය කිරීමට හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.1, 5.1.2 හා 5.1.3 ඡේද | චක්‍රලේඛයේ 5.1.1 හා 5.1.2 ඡේද ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර, 5.1.3 ඡේදය ප්‍රකාරව එහි පිටපත් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ 5.2 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සභාපතිවරයාට සමාලෝචිත වර්ෂය තුළදී කොවිඩ් 19 දීමනා ලෙස රු.454,827 ක් කිසිදු අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | මේ වන විට මෙම ගෙවීම් අත්හිටුවා ඇති බව. | ගෙවූ දීමනා ආපසු අය කිරීමට හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

(උ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

---------------------

| | | | |
|---|---|---|---|
| (i) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (ආ) හා (ඇ) ඡේද | ලිත් මාසයකට උපරිම දින 02 ක් සඳහා පූර්ව අනුමැතිය මත නිවාඩු දිනවල සේවයේ යෙදවීමට හා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු අතර දින 02 කට වැඩි ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව අධිකාරියේ විධායක නිලධාරියෙකු ඇතුලු මාණ්ඩලික නිලධාරීන් 22 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී නිවාඩු දින 415 ක් වෙනුවෙන් රු.909,042 ක් ගෙවීම් කර තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යංශයේ ලිපිවල අනුමැතිය පදනම් කර ගනිමින් මෙම ගෙවීම් සිදු කළ බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත් වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, අධිකාරිය විසින් භාවිතා කරන වාහන 09 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | වාහන වල ඉන්ධන දහනය කිරීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කිරීමට මේ වන විට අවශ්‍ය උපදෙස් අදාළ පාර්ශවයන් වෙත ලබාදී ඇති බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සහ 2021 වර්ෂ තුළදී පවත්වා තිබුණු විවිධ කමිටු සඳහා සහභාගීත්ව දීමනා, කොවිඩ් දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් එකතුව රු.629,030 ක්, මුදල් රෙගුලාසි 271(2)(අ) සහ (ආ) ප්‍රකාරව අදාළ නිලධාරීන් වෙත ගෙවීමට හෝ දින 14 කදී ආපසු බැංකුගත කිරීමට හෝ කටයුතු නොකර අධිකාරියේ ගණකාධිකාරී විසින් දින 159 ත් දින 865 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. මෙම දීමනා ගෙවීම් | ගණන්දීමේ නිලධාරී විසින් අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරිනිය වෙත නියෝග කළ යුතුය. |

සඳහා පිළියෙල කරන ලද ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳව විමසීමේදී ඊට පසු දින එනම් 2022 ජුනි 08 දින රු.629,030 ක් සෘජුවම බැංකු ගත කර තිබුණි. මීට අමතරව 2022 වර්ෂයේදී  කමිටු සහභාගිත්ව දීමනා,  ප්‍රසාද දීමනා, පැමිණීමේ දීමනා හා අතිකාල දීමනා වශයෙන් එකතුව රු.537,600 ක් අදාළ නිලධාරීන් වෙත ගෙවීමට හෝ ආපසු බැංකුගත කිරීමට හෝ කටයුතු නොකර දින 15 ත් දින 228 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණු බව 2022 අගෝස්තු 23 දින සිදු කරන ලද භෞතික මුදල් සත්‍යාපනයේදී තහවුරු විය. මෙය රජයේ මුදල් අයථා පරිහරණයක් වන බව නිරීක්ෂණය වූ අතර මුදල් රෙගුලාසි 271(1) ප්‍රකාරව නොගෙවා ඉතිරිව ඇති මුදල් හා ඒවාට අදාළ ලියවිලි සේප්පුවක හෝ ඒ සඳහා නියමිත වෙනත් සුරක්ෂිත ස්ථානයක තැන්පත් කොට අගුළු ලා තැබිය යුතු වුවද, මෙම මුදල්  ගණකාධිකාරීගේ කාර්යාල මේස ලාච්චුවේ අනාරක්ෂිතව රඳවා තිබුණු අතර අගුළු දෙකකින් හා කේතයකින් සුරක්ෂිත ආරක්ෂිත සේප්පුව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ නිෂ්කාර්යව රඳවා තිබුණි.

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ  කොන්ත්‍රාත්තුව මුළු  කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 මැයි 03 දින ප්‍රදානය කර තිබුණි.  මෙම ලේඛන සහ කාර්යප්‍රවාහ කළමනාකරණ පද්ධතිය සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීම Operational Expenditure Financing මොඩලය අනුව ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගතවී තිබුණු අතර  2019 ජුනි මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා හෝ මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු සමහර තොරතුරු මකා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන කටයුතු අවසන් වන තෙක් හා 2022 අගෝස්තු 31 දින වන විටත් සේවාව අක්‍රීය තත්වයට පත්වී තිබුණි. එසේම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදේශනය, කළමනාකාරීත්වය හා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය  සමඟ 2018 ජුනි 25 දින වර්ෂයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්ෂ 05 ක් වූ කොන්ත්‍රාත් කාලයට සමාන්තරව එම ගිවිසුම දීර්ඝ කිරීමට  කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ සැලකිලිමත් වීමට, මුරපද | e -NMRA පද්ධතිය බිඳ වැටීමෙන් පසු මේ දක්වා එම පද්ධතිය භාවිතා නොකරන බැවින්, ඖෂධ, උපකරණ ආදිය ලියාපදිංචි කිරීමේ කටයුතු වලට අදාළ දත්ත ඇතුල්කිරීම සඳහා Google Sheets භාවිතා කරන බව, මෙම යෙදවුම මගින් පද්ධතියකින් බලාපොරොත්තු වන කාර්යයන් සිදු කර ගැනීම අපහසු බව, විධිමත් පද්ධතියක් ස්ථාපිත කරන තෙක් අභ්‍යන්තර ආයතන කටයුතු පහසු කර ගැනීම සඳහා සිදුකරන ලද තාවකාලික දත්ත ඇතුලත් කිරීමේ | අධිකාරියේ දත්ත පද්ධතියේ පවත්නා අඩුපාඩු නිවැරදි වන අකාරයට පහසුවෙන් මෙහෙයවිය හැකි සුදුසු තොරතුරු පද්ධතියක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

| | |
|---|---|
| වෙනස් කිරීමට හෝ තොරතුරු අවභාවිතා කිරීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණු අතර පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමෙන් පසු manual හා automation පද්ධති දෙක සමාන්තරව ක්‍රියාත්මක කර අධිකාරියේ අභ්‍යන්තර වැඩ ප්‍රවාහය (workflow) පිළිබඳ විගණන පරීක්ෂණයක් (Audit trial) සිදුකර නොතිබුණි. එමෙන්ම ලිපිගොනු කළමනාකරණය, සංරක්ෂණය හා ලේඛන පිටපත් ආරක්ෂිතව වර්ෂ 05 ක් දක්වා අදාළ දත්ත සමඟ ගබඩා කිරීමේ හැකියාව, දිනපතා, සතිපතා හා මාසිකව ස්වයංක්‍රීය පිටපත් ලබා ගැනීම හා වෘත්තීමය වගකීම් රක්ෂණාවරණ ලබාගැනීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම යන කරුණු කෙරෙහි කළමනාකරණය සැලකිලිමත්වී නොතිබුණු අතර අදාළ දත්ත හා ඇමුණුම් තොරතුරුවල ආරක්ෂිත පිටපත් ලබානොගෙන සමාගම වෙත ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, පිරිවැය රු.7,558,128 ක් වූ මෙම පද්ධතිය තුළ වූ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වුවද, ඒ වෙනුවට එම මුදල ලාභයට එරෙහිව කපාහැර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා මකාදමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කිරීමට පත්කර තිබුණු විශේෂඥ කමිටුව විසින් 2022 ජූලි 15 දිනැතිව නිකුත් කර තිබුණු වාර්තාවට අනුව, පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව තහවුරු කර තිබුණි. මෙම පද්ධතියේ කටයුතු අක්‍රීය කළ පසු තාවකාලික පිළියමක් ලෙස ගූගල් යෙදුමක් (Google Form) භාවිතයෙන් ඖෂධ, උපකරණ ආදිය ලියාපදිංචි කටයුතු සිදුකරන නමුත් එම ක්‍රමය අඩුපාඩු සහිතව පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. | ක්‍රමවේදයක් වන බව. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.567,192,769 ක ශුද්ධ ආදායමක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ශුද්ධ ආදායම රු.673,604,866 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.106,412,097 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු.400,000,000 ක් භාණ්ඩාගාර බදු ලෙස දැරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 14 (ඒ) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කර නොතිබුණි. | ආනයනික වෛද්‍ය උපකරණවල ප්‍රමාණය හා ඒකක මිල ගණන් පිළිබඳ දත්ත රැස් කරගැනීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කළ බව, 2022 මාර්තු 01 දින සිට ආනයනය කළ ඖෂධ ප්‍රමාණය පිළිබඳ විස්තර අධිකාරිය වෙත දන්වන ලෙස 2022 පෙබරවාරි 23 දින වෙබ්අඩවිය තුළ දැන්වීමක් පළ කර ඇති බව, ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ආනයනකරුවන් විසින් අදාළ ඖෂධයේ | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පෙර වර්ෂයන්හි ආනයනය කළ ප්‍රමාණයන් 2022 මාර්තු 04 දින සිට GOOGLE SHEET හී ඇතුළත් කිරීම ආරම්භ කර ඇති බව හා ආනයනික සීමාස්ථ නිෂ්පාදනවල ප්‍රමාණ පිළිබඳ දත්ත ඖෂධ නියාමන අධිකාරිය සතුව නොමැති බව. | |
| (ආ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 41 (2), 66 (2) හා 87 (2) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine Devices Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි. | එම අංශයන්හි ප්‍රධානින් ලෙස ඉහල පළපුරුද්දක් සහිත සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් පත්කර ඇති බව, අධිකාරියෙහි සේවා අවශ්‍යතාවය මත හා ඖෂධවේදීන්ගේ සුදුසුකම් මත අන්තර්ග්‍රහණය කර අවසන් වූ වහාම සුදුසුකම් ලත් නිලධාරීන් නියාමන කටයුතු සම්බන්ධ අංශයන්හි ප්‍රධානින් ලෙස පත් කිරීමට අපේක්ෂා කරන බව. | -එම- |
| (ඇ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 69(1)(ආ)(v) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කළ යුතු වුවද, එම පත්කිරීම සිදුකර නොතිබුණි. වෛද්‍ය උපකරණද ඇතුළුව විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය හා භාවිතය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම හා නියාමනය පිළිබඳ බලතල හිමි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවට වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. | විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය කිරීමේදී හා ලියාපදිංචිය සඳහා සාම්පල ආනයනයට බලපත්‍ර නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාවේ සහතික ලබා ගන්නා බව. | -එම- |
| (ඈ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 72(1) හා 93(1) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා ඒ ඒ ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි. තවද 72 (4) හා 93(4) උප වගන්ති ප්‍රකාරව අදාළ ඇගයීම් පැවැත්වීම සඳහා වූ නිශ්චිත කාලසීමා ඇතුළු | පොදු මාර්ගෝපදේශ හා ඒවා බලාත්මක කිරීම සඳහා නියෝග මේ වන විට පිළියෙල කර සාකච්ඡා මට්ටමේ පවතින බව හා සීමාස්ථ නිෂ්පාදන නියාමනය සඳහා නියෝග නොමැති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහන් කරමින්, යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ අධිකාරිය විසින් නිර්දේශ කරන වෙනත් අදාළ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධ නියෝග පිළියෙල කරද නොතිබුණි. | | |
| (ඉ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 74 (1) හා 95(1) උප වගන්ති ප්‍රකාරව, අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ හා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන අමාත්‍යවරයා විසින් කලින් කල ලැයිස්තුගත කර නොතිබුණි. | සති දෙකකට වරක් 50 ත් 100 ත් අතර අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලියාපදිංචියට හෝ ප්‍රතික්ෂේපවීමට නිර්දේශ වන බැවින් නිරන්තරයෙන් ගැසට් නිකුත් කිරීම ප්‍රායෝගිකව අපහසු වන බව හා ඒ පිළිබඳ අදහස් පනත සංශෝධනය කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | -එම- |
| (ඊ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 83(6) හා 102(6) උප වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයා විසින්, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය යන ආයතන විසින් පරීක්ෂා කිරීමේ හෝ ඇගයීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම පරීක්ෂා කිරීම් හෝ ඇගයීම් ක්‍රියාවලියේ කාල සීමාවන්, වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් රැස්වීම් පැවැත්විය යුතු ආකාරය හා එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඉදිරිපත් කළ යුතු වාර්තාවල ඇතුළත් කළ යුතු කාරණා නිශ්චිතව දක්වමින් නියෝග පිළියෙල කර නොතිබුණි. | මේ සම්බන්ධ නියෝග ඉදිරියේදි පිළියෙළ කරන බව. | -එම- |
| (උ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | ගරු අමාත්‍යතුමන් විසින් අභියාචන කමිටුව පත් කළ යුතුව ඇති බව. | -එම- |
| (ඌ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය ප්‍රකාරව සියළුම රජයේ ආයතන, තම ආයතනය විසින් | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කර, අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් තම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයද සහිතව භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික නිකුත් කිරීම, බලපත්‍ර ලබාදීම, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය, ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය, නියෝජිතායතන පැවරීම සඳහා අනුමැතිය වැනි අනුමැතීන් ලබාදීම, පරීක්ෂණ පැවැත්වීම සහ සපයනු ලබන අනෙකුත් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු 2018 ජනවාරි 05 දින අවසන් වරට සංශෝධනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තු සමාලෝචනය කර අදාළ සංශෝධනයන් භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගාස්තු ආදායම රු.187,913,601 කින් පමණ අහිමිවී තිබුණි. | | |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 18 කදී නිලධාරීන්ගේ අතපසුවීම් හා වෙනත් විවිධ හේතු මත එකතුව රු.1,620,119 ක ආදායම් ආපසු ගෙවා තිබුණි. මෙම තත්ත්වය වර්ෂ කිහිපයක සිට පැවති නමුත් අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | අධිකාරියේ නිලධාරින්ගේ අතපසුවීම් හේතුවෙන් ආදායම් ආපසු ගෙවීමට සිදුවන බව, මෙම ආපසු ගෙවීම් විධිමත් කිරීමට 2022 වර්ෂයේදී එකතු කළ අදායම් ආපසු ගෙවීම් කමිටුවක් පත් කළ බව හා එම කමිටු අනුමැතියෙන් VAT බදු මුදල් හා මුද්දර ගාස්තු හැර ඉතිරි ආදායම් ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දුන් බව. | ආදායම් ආපසු ගෙවීම් අවස්ථා අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Drugs Quality Assurance Laboratory) විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 | මෙම සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා තවමත් පරීක්ෂණාගාරයෙහි නොමැති බැවින් මෙම සහතිකය ලබා ගැනීම ප්‍රමාදවී ඇති බව. | මෙම සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සපයා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 ජූලි 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණු අතර ලබාගෙන ඇති වෙනත් ප්‍රමිති සහතික පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | | |
| (ඔ) | 2018 වර්ෂයේදී, සේවක භාරකාර අරමුදලට ප්‍රමාදවී මුදල් යැවීම, වැට් බදු නිදහස් කිරීම නියමිත කාලය තුළ ඉල්ලීම් නොකිරීම හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ගෙවා තිබුණු වැට් බදු අයකර ගැනීමට ඉල්ලීම් කර තිබුණු නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේපවීම වැනි කරුණු හේතුවෙන් අධිභාර හා වැට් බදු ලෙස මුළු මුදල රු.756,173 ක් සමාලෝචිත වර්ෂය තුළදී දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ගෙවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟවන බව. | අධිභාර හා වැට් බදු ලෙස වැඩිපුර මුදල් ගෙවීමට සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගත යුතුය. |
| (ඕ) | 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2017 ජුනි 14 දිනැති අංක 2023/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 2017 අංක 02, 03 හා 04 දරන ගාස්තු නියෝගයන් ප්‍රකාරව ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන පෞද්ගලික සැපයීම් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමට ඉල්ලුම් කිරීමේදී ගාස්තු අය කළ යුතු වුවද, අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ප්‍රදානය කිරීමේදී ගාස්තු අය කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතික්ෂේප කර තිබුණු පෞද්ගලික අංශයේ වෛද්‍ය උපකරණ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ඉල්ලුම්පත් 207 ක් සඳහා අය කළ හැකිව තිබුණු රු.11,473,421 ක ගාස්තු ආදායම අධිකාරියට අහිමිවී තිබුණි. 2018 වර්ෂයේ සිට 2022 අගෝස්තු 22 දින දක්වා කාලය තුළදී ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධයෙන් මෙලෙස කටයුතු කර තිබීම හේතුවෙන් අධිකාරියට ගණනය කළ නොහැකි විශාල ආදායමක් අහිමිවී තිබුණි. | අයදුම්කරුවන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසු හා ගැසට් පත්‍රයේ දැක්වෙන ආකාරයට ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේ මුදල් අය කර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති වූ බැවින් එවකට ප්‍රධාන විධායක නිලධාරී විසින් වාචිකව ලබා දුන් උපදෙස් ප්‍රකාරව අයදුම්පත්‍රය අනුමතවීමෙන් පසු පමණක් මුදල් අයකර ගත් බව. | ගැසට් පත්‍රයේ සඳහන් පරිදි ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | අධිකාරිය විසින් වැඩ නිමකළ ලිපිගොනු ප්‍රවාහනය කර ආරක්ෂිතව ගබඩා කර පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 01 දින සිට පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 06 ක කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු වෙත රු.6,062,550 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂයේදී එවකට කොන්ත්‍රාත්කරු භාරයේ පැවති ලිපිගොනු කොටසක් ගංවතුරෙන් හානි වී තිබුණු බව සඳහන් කරමින් 2016 මැයි මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා වූ වර්ෂය වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම් නවතා තිබුණු නමුත් ගංවතුරෙන් හානිවී තිබුණු ලිපිගොනු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, 2022 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගනිමින් පැවති අතර වර්ෂ 06 ක් තිස්සේ මේ සඳහා වැයවන පිරිවැය විශ්ලේෂණය කර අධිකාරිය විසින්ම ලේඛනාගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | ගංවතුරින් හානිවී තිබුණු ලිපිගොනු ආරක්ෂාකාරීව වෙනත් ගබඩාවක් වෙත ගෙන ගොස් අදාළ පරීක්ෂාවන් සිදුකළ බව, ඉන් පසු එම ලිපිගොනු වල අනුපිටපත් අදාළ ආයතන වෙතින් ලබාගැනීමට කටයුතු කර ඇති බව, කෙසේ වෙතත් මෙම ගබඩාවල මේ වන විට පවතින ලිපිගොනු පිළිබඳ වාර්තා නැවත පරීක්ෂා කර අවශ්‍යය නිවැරදි කිරීම් සිදුකිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇති බව, ස්ථානීය පරීක්ෂාව 2022 වසරේදී සිදු කිරීමට අවශ්‍යය කටයුතු යොදා ඇති බව, ලිපිගොනුවල ආරක්ෂාව තහවුරු කිරීමට, අදාළ ආයතනය සමඟ මේ වන විටත් ගිවිසුම්ගතවී ඇති බව හා අධිකාරිය සතු ලේඛනාගාරයක් පවත්වාගෙන යාමට හැකි වන පරිදි අවශ්‍යය කටයුතු සම්පාදනය කර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව. | ගංවතුර හානිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමටත්, අධිකාරිය සඳහා ලේඛනාගාරයක් ඉදිකිරීම පිළිබඳ අවධානය යොමු කිරීමටත් කටයුතු කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 39 වගන්තිය ප්‍රකාරව, තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර තිබුණු ඖෂධ සාම්පල් අතරින් 2021 ජනවාරි 01 දින වන විට පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු ඖෂධ සාම්පල් ප්‍රමාණය පිළිබඳව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වෙතත් 2019 හා 2020 වර්ෂ වලදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් 216 ක් අතරින් 157 ක් සඳහාද, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් 477 කින් 299 ක් සඳහාද, පමණක් සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂණ සහතික නිකුත් කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 03 තුළදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් | විශ්ලේෂණයට ලැබෙන සියළු සාම්පල පිළිබඳ තත්ත්ව වාර්තා එම වර්ෂය තුළදීම හෝ ඊළඟ වර්ෂ තුළදීද නිකුත් කරන බව. | පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කරන ඖෂධ සාම්පල්වලට අදාළ තත්ත්ව වාර්තා නොපමාව නිකුත් කිරීමට හා ඒ පිළිබඳ දත්ත හා තොරතුරු විධිමත්ව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතරින් 2022 ජූලි 31 දින වන විටත් පරීක්ෂණ වාර්තා නිකුත් කර නොතිබුණු සාම්පල් සංඛ්‍යාව 91 ක් වූ අතර ඉන් 42 ක්ම අධිකරණය විසින් ඉදිරිපත් කර තිබුණු සාම්පල් විය. අදාළ අධිකරණ කටයුතු සැලකිය යුතු කාලයක සිට ප්‍රමාදවීමට එය හේතුවන බවට වූ මතය විගණනයේදී බැහැර කළ නොහැකි වේ. | | |
| (ආ) | ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් වෙනුවෙන් නැවත ලියාපදිංචි සහතික නිකුත් කිරීම වෙනුවට, පැවති ලියාපදිංචිය දිර්ඝ කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණු නමුත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් 3,892 කින් අයදුම්පත් 2,904 ක් වෙනුවෙන් පැවති ලියාපදිංචිය දීර්ඝකර තිබුණු අතර අයදුම්පත් 988 ක් ප්‍රතික්ෂේප කර තිබුණි. ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම හේතුවෙන් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 47(3) හා 59(4) උප වගන්ති ප්‍රකාරව ඖෂධ ඇගයීමට අදාළ විධිවිධාන උල්ලංඝනයවී තිබුණු බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟවන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 43(2) (අ) හා (ආ) සහ 68 (2) (අ) හා (ආ) උප වගන්ති ප්‍රකාරව, ඖෂධ ඇගයීම් කමිටුව හා වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඖෂධ හා වෛද්‍ය උපකරණවල ප්‍රතිලාභ, අවදානම්, ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිල සහ අවශ්‍ය අවස්ථාවලදී එම ඖෂධවල ඖෂධ ආර්ථික විශ්ලේෂණය නිශ්චිතව දක්වා තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, ඖෂධ ඇගයීම් කමිටුව හා වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් එවැනි තාක්ෂණික ඇගයීම් වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් එවැනි තාක්ෂණික ඇගයීමක් සිදු කළ යුතු වුවද, වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව මසකට වරක් රැස්වී අයදුම්පත් 50 ත් 100 ත් අතර ප්‍රමාණයක් ඇගයීම් කරන බැවින් එම වාර්තා සැපයීම ප්‍රායෝගීව අපහසු බව, එබැවින් මෙම ඇගයීම වෛද්‍ය උපකරණ නියාමන අංශය විසින් සිදු කරන බව, මෙම ගැටලු පිළිබඳව වෛද්‍ය උපකරණ නියාමන අංශය මඟින් අධිකාරී පනත සංශෝධනය කිරීමේ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇති බව හා ඖෂධ පිළිබඳ තාක්ෂණික ඇගයීම ඖෂධ ඇගයීම් උප කමිටුව විසින් සිදුකරන බව. | -එම- |
| (ඈ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 83 (4) (ආ) හා 102(4)(ආ) උප වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන | වෛද්‍ය උපකරණවල සායනික ඇගයීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී තුන්වන පාර්ශවයකින් ලබා ගත් තත්ත්ව ආරක්ෂණය පිළිබඳ වාර්තාවක් (Third | -එම- |

| | | | |
|---|---|---|---|
| | වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් පර්යේෂණාගාරය තුළ නොපවතින බවට අධිකාරියේ සභාපති විසින් අදහස් ඉදිරිපත් කර තිබුණි. | Party Test Report) සමඟ ඉදිරිපත් කළ යුතු වුවද, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ එවැනි වාර්තා ලබාගැනීමේ සම්පූර්ණ පහසුකම් අද වන විටද නොමැති බව, විවිධ අමුද්‍රව්‍යයන්ගෙන් සැදුම්ලත් නිෂ්පාදන සීමාස්ථ නිෂ්පාදන යටතේ ලියාපදිංචි වන බව, එම නිෂ්පාදන බොහෝමයක ඖෂධ කාණ්ඩයට ගැනෙන අමුද්‍රව්‍ය හා ඖෂධ කාණ්ඩයට නොගැනෙන අමුද්‍රව්‍ය අඩංගු බැවින් එම නිෂ්පාදන පරීක්ෂා කිරීමේ හැකියාවක් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ නොපවතින බව. | |
| (ඉ) | ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ගොනුවක් (Dossier) ඇගයීම සම්පූර්ණ කිරීමේ උපරිම කාලය දින 300 ක් වුවද, 2020 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු Dossiers 146 කට 2022 ජුනි 25 දින වන විටත් ලියාපදිංචි සහතික නිකුත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචි කර තිබුණු වෛද්‍ය උපකරණ ඩොසියර 25 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ඩොසියර 06 කම ප්‍රධාන ඇගයීම් කටයුතු සඳහා දින 02 ක්ද, තවත් ඩොසියර 04 ක ප්‍රධාන ඇගයීම් කටයුතු සඳහා මාසයකට අඩු කාලයක්ද ගත කර තිබුණු නමුත් ලියාපදිංචිය අවසන් කිරීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාල පරාසයක් ගත කර තිබුණි. ඩොසියර 18 ක් අධිකාරියට ලද දින සිට ප්‍රධාන විධායක නිලධාරී විසින් ඖෂධවේදීන් වෙත පැවරීමට මාස 01 ½ ක සිට වර්ෂ 01 ත් අතර කාලයක් ගත කර තිබුණු අතර ඖෂධවේදීන් විසින් ඩොසියර 11 ක් කාර්යසාධන ඇගයීම සඳහා අදාළ විදුහල (College) හෝ බාහිර ඇගයුම්කරු (External Evaluator) වෙත ඉදිරිපත් කිරීමට මාස 05 ත් වසර 01 මාස 09 ත් අතර කාලයක් ගත කර තිබුණි. කාර්යසාධන ඇගයීමෙන් පසු ඩොසියර 09 ක තාක්ෂණික ඇගයීම ආරම්භ කිරීම සඳහා ඖෂධවේදීන් විසින් මාස 05 සිට වසර 01 මාස 04 ක් දක්වා කාලයක් ගත කර තිබුණු අතර වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් ලියාපදිංචිය සඳහා අනුමත කරන ලද ඩොසියර 09 ක් සඳහා එදින සිට ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමැතිය ලබාදීමට දින 14 සිට මාස 02 දක්වා කාලයක් ගත කර තිබුණි. නමුත් අධිකාරිය විසින් මෙම | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව, වෛද්‍ය උපකරණයේ ස්වභාවය, ප්‍රමාණය, අවධානම, සායනික පරීක්ෂාව, වෘත්තිය විද්‍යාලය වෙත යැවීම, ශල්‍ය කටයුතු මෙන්ම රෝගියෙකු සඳහා යොදා ගැනීම හා ජෛව සාම්පල සඳහා යොදා ගැනීම ආදී විවිධ ක්‍රම එකකින් හෝ කිහිපයක් මඟින් පරීක්ෂා කළ යුතුවීම හේතුවෙන් පරීක්ෂණ කාලය නිශ්චිත කොට දැක්වීම අපහසු බව, නියාමන අධිකාරිය ස්ථාපිත කළද සිදුවිය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවී නොතිබීම, ගබඩා පහසුකම් නොමැතිකම, නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, අයදුම්පත් අඩු පාඩු සහිතවීම, ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වීම, ඒවා නිවැරදි කිරීමට ගතවන කාලය මෙම මුලු කාලයට එකතු වීම හා COVID වසංගතය රට තුළ ව්‍යාප්ත වීමද මේ සඳහා බලපා ඇති බව, කෙසේ වුවද මෙම තත්ත්වය හඳුනා ගෙන ඒ සඳහා විසඳුම් ගණනාවක් මේ වන විට ලබාදී ඇති බව. | ඇගයීමේ හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාදයන් අවම කර ගැනීමට හා ලියාපදිංචි ක්‍රියාවලිය කාර්යක්ෂම හා වේගවත් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඊ) | කාර්යසාධන ඇගයීම සඳහා දන්ත වෛද්‍යවරුන්ගේ විදුහල (College of Dentistry and Stomatology) වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණු වෛද්‍ය උපකරණ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු ඩොසියරයක් පළමුව මහරගම අපේක්ෂා රෝහල වෙතද අනතුරුව රසායනික රෝග විශේෂඥවරයෙකු (Consultant- Chemical Pathology) වෙතද ඉදිරිපත් කර අවසානයේදී දන්ත වෛද්‍යවරුන්ගේ විදුහල වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් ඩොසියරය ලැබී තිබුණු දින සිට වර්ෂ 03 මාස 03 ක කාලයකට පසුව ලියාපදිංචි සහතිකය නිකුත් කර තිබුණි. එසේම නිර්වින්දන වෛද්‍යවරුන්ගේ විදුහල (College of Anesthesiologist) වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණු වෛද්‍ය උපකරණ ලියාපදිචිය සඳහා ඉදිරිපත් කර තිබුණු ඩොසියරයක් උගුර කණ නාසය පිළිබඳ විශේෂඥවරුන්ගේ විදුහල (College of ENT Surgeons) වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් ඩොසියරය ලැබී තිබුණු දින සිට වර්ෂ 02 මාස 01 ක කාලයකට පසුව ලියාපදිංචි සහතිකය නිකුත් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් වෛද්‍ය උපකරණවල කාර්යසාධන ඇගයීම සිදු කළ යුතු විදුහල තීරණය කිරීම සම්බන්ධයෙන් ඇගයීම් කමිටුව වෙත විධිමත් මගපෙන්වීමක් හඳුන්වාදී නොතිබුණු බවත්, වෘත්තීය විනිශ්චය මත පදනම්ව නිවැරදි විදුහල තෝරා නොගැනීම හේතුවෙන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වන අවස්ථා පවතින බවත් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව, සායනික ඇගයීමට වෘත්තීය විදුහල තෝරාගැනීම අතිශය තාක්ෂණික කාරණාවක් වන බව. | තාක්ෂණික කරුණු පදනම්ව සායනික ඇගයීම කාර්යක්ෂම කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඩොසියර පවත්වාගෙන යාමේදී හා අදාළ ලේඛන පිළියෙළ කිරීමේදී නොසැලකිලිමත්ව හෝ හිතාමතා හෝ වැරදි තොරතුරු ඇතුළත් කර තිබුණු අතර ඇතැම් කාර්යයන් ඉටුකළ දිනයන්, ඉටුකළ නිලධාරීන් පිළිබඳ තොරතුරු හා ඇතැම් අත්‍යාවශ්‍ය ලේඛන ඩොසියර තුළ ඇතුළත් කර නොතිබුණි. ඇතැම් ඩොසියර තුළ කාර්යසාධන ඇගයීම | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඩොසියර තුළ කාර්යසාධන හා තාක්ෂණික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුවක් ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ඩොසියරය හා සාම්පල අදාළ විදුහල වෙත ඉදිරිපත් කළ සහ නැවත ලද දිනයන්, ඖෂධවේදීන් විසින් තාක්ෂණික ඇගයීම ආරම්භ කළ හා අවසන් කළ දිනයන් මෙන්ම ඖෂධවේදීන්ගේ නිර්දේශය, කේතය හා අත්සන් සඳහන්ව නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුව තුළ සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබුණි. ඇතැම් ඩොසියර තුළ අයදුම්පත පිළිබඳ සාරාංශ වාර්තාව සහ ඖෂධවේදීන් විසින් තාක්ෂණික ඇගයීම සිදු කර නිර්දේශ ලබා දෙන තාක්ෂණික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුව ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඌ) | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට සාමාජිකයන් 20 දෙනකු පත්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු රැස්වීම් 10 ක් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය සියයට 35 ක් වැනි අඩු මට්ටමක පැවති අතර සමාජිකයින් 07 දෙනෙකු එකදු රැස්වීමකට හෝ සහභාගීවී නොතිබීම හේතුවෙන් රසායනාගාර සේවා, ජීව වෛද්‍ය විද්‍යා ඉංජිනේරු, දන්ත වෛද්‍ය සේවා, ජීව රසායන විද්‍යා, ශල්‍ය රෝග සහ විකිරණ වේදය වැනි විශේෂඥ ක්ෂේත්‍රවල දැනුම කමිටු තීරණ සඳහා දායකවී නොතිබුණි. | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව සඳහා සාමාජිකයින් 20 දෙනෙකු පත් කර ඇති බව, එම සියලු සාමාජිකයින් වෙත විද්‍යුත් තැපැල මඟින් කමිටුව සඳහා සහභාගී වන ලෙස දැනුවත් කරන බව, එසේම දුරකථන මාර්ගයෙන්ද එම දැනුවත් කිරීම කරන බව. | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ උපරිම සහභාගිත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ඔසුසල් බලපත්‍ර ලබා ගැනීම සඳහා මාර්ගගත (online) ක්‍රමය මත මුදල් ගෙවා තිබුණු නමුත් මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතිය 2021 අගෝස්තු මාසයේදී බිදවැටීම හේතුවෙන් නව බලපත්‍රයක් නිකුත් කිරීම වෙනුවට 2019 හා 2020 වර්ෂවලදී නිකුත් කර තිබුණු බලපත්‍ර මත රබර් මුද්‍රාව තබා ඒ මත දින දීර්ඝ කර අත්සන යොදා තිබුණි. එම දින දීර්ඝ කිරීම් ලේඛනගත කර නොතිබුණු අතර දින දීර්ඝ කිරීම් සඳහා අත්සන් තබා නොතිබුණු අවස්ථාද විය. | මාර්ගගත පද්ධතිය බිඳ වැටීම නිසා බලපත්‍ර ලබාදීමට නව ක්‍රමවේදයක් සැකසීම ක්ෂණිකව අපහසු වූ බැවින් තාවකාලික පියවරක් ලෙස මෙම ක්‍රමය අනුගමනය කළ බව, එසේ වලංගු කාලය දීර්ඝ කළ සියලුම බලපත්‍රවල ස්කෑන් පිටපත්(Scan Copies) දිස්ත්‍රික්ක අනු පිළිවෙල අනුව පරිගණකය තුළ ගබඩා කර ඇති බව හා මෙම වලංගු කාලය දීර්ඝ කළ බලපත්‍රවල අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී හෝ ඔහුගේ බලයලත් නිලධාරියා විසින් විධිමත් පරිදි අත්සන හා රබර් මුද්‍රාව යොදා ඇති බව. | බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීමට ආරක්ෂිත වැඩපිළිවෙලක් යෙදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුලී පදනම මත ලබා ගෙන තිබුණු නව කාර්යාල ගොඩනැගිල්ලේ කාර්යාල කාමර වෙන් කිරීමේ (Partition) කාර්යය සඳහා රු.4,898,750 ක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත 2020 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 2.12, 5.4.8, 6.3.3, 6.3.6 හා 8.12.2 යන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කර නොතිබුණු අතර 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව රු.979,750 ක අත්තිකාරම් නිකුත්කර තිබුණි. | කොරෝනා තත්ත්වය මත ප්‍රවාහන සීමා පැනවීම හේතුවෙන් මිල ගණන් විද්‍යුත් තැපැල මගින් කැඳවූ බව, නව ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම 2020 නොවැම්බර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි අත්සන් කර තිබීම හේතුවෙන් හා කාමර වෙන්කිරීම් කර කාර්ය මණ්ඩලයට පහසුකම් සැපයිය යුතුව තිබීම හේතුවෙන් ඒ ආකාරයට මිල ගණන් ලබා ගත් බව | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.6,854,519 ක් වැයකර වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් ලී බඩු මිලදී ගෙන තිබුණු නමුත්, රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 ප්‍රකාරව, මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතු වුවද, මිල ගණන් 03 ක් පමණක් කැඳවා මිලදී ගැනීම සිදුකර තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 6.3.5 (අ), (ආ), (ඇ), 6.3.6, 8.12.3 (අ),(ආ),(ඇ) යන මාර්ගෝපදේශවල සඳහන් විධිවිධානවලට පටහැනි වන ලෙස කටයුතු කරමින් මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි. | රටෙහි පැවති කොරෝනා තත්වය, ලී බඩු වල විශාල හිඟය, පුවත්පත් නිසි ආකාරව මුද්‍රණය නොවීම හා ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම 2020 නොවැම්බර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි අත්සන් කර තිබීම වැනි හේතු නිසා මිල ගණන් කැඳවීම ප්‍රයෝගික නොවීම මත සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් කැඳවා ඇතත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් ගෙන නොමැති බව හා ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කරගන්නා බව. | -එම- |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 9.3.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.200,000 කට වැඩි වාහන අළුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එම සීමාව ඉක්මවා අධිකාරිය සතු වාහන 03 ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් එකතුව රු.3,676,401 ක් වැයකර තිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අළුත්වැඩියාවේදී ඉවත් කළ අමතර කොටස් හා ඒවා භාරගත් බවට ලොග් සටහන් තබා නොතිබුණි. වාහන භාර නිලධාරියා විසින් එම අමතර කොටස් භාර ගෙනද නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | -එම- |

3.4 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට අනුමත ස්ථිර කාර්යමණ්ඩලය 235 ක් සහ කොන්ත්‍රාත් පදනම මත 22 ක් ලෙස මුළු අනුමත කාර්යමණ්ඩලය 257 ක් විය. මුළු තථ්‍ය කාර්යමණ්ඩලය 160 ක් වුවද ඉන් 38 දෙනෙක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන අතිරික්ත සංඛ්‍යාවක් වූ බැවින් 2021 දෙසැම්බර් 31 දිනට අනුමත මුළු කාර්ය මණ්ඩලයෙන් සත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 135 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ඉහළ කළමනාකරණ තනතුරු 19 කින් තනතුරු 16 ක් හෙවත් සියයට 84 ක්ම පුරප්පාඩුවී පැවතුණු බැවින් අවශ්‍ය හා අවශ්‍ය නොවන තනතුරු හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර අවශ්‍ය තනතුරු පුරප්පාඩුවී පැවතීම අධිකාරියේ සමස්ත කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය. ඖෂධ ඇගයීම් නිලධාරීන් 30 දෙනකු සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 12 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ හෝ බඳවා ගැනීමේ ක්‍රමවේදය මෙම වාර්තාවේ දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ස්ථිර තනතුරු අතරින් මේ වන විට පුරප්පාඩු 109 ක් පමණක් පවතින බව, ඖෂධ විශ්ලේෂක තනතුරු 12 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමතවී ඇතත් අදාළ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර නොමැති බව හා තවත් තනතුරු 09 ක පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ සඳහා දින නියම කර ඇති බව. | අවශ්‍ය හා අවශ්‍ය නොවන තනතුරු හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ හෝ බඳවා ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
----------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 02 ක ප්‍රමාදයකින් පසුව 2022 අප්‍රේල් 22 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අවසන් ගිණුම් නියමිත පරිදි පිළියෙළ කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

4.2 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසන්වී මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අධිකාරිය විසින් එම මුදල් වර්ෂය ඇතුළත සිදුකරනු ලැබූ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවට විගණකාධිපති වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා වූ අධිකාරියේ විගණනය කරන ලද ගිණුම් වාර්තාව සහ එළඹෙන වර්ෂය සඳහා වූ යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්ද අමුණා තැබිය යුතුය. එම වාර්තාව ලද දින සිට මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, 2017 වර්ෂයේ සිටම වාර්ෂික වාර්තා පිළියෙල කර අමාත්‍යවරයා වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2017, 2018, 2019 හා 2020 වර්ෂ සඳහා වාර්ෂික වාර්තාවල පරිවර්තන කටයුතු හා මුද්‍රණ කටයුතු ඉතිරිව ඇති බව, 2021 වර්ෂයට අදාල අවසන් ගිණුම් විගණනය සඳහා යොමු කර ඇති බව හා වාර්ෂික වාර්තාවට අඩංගු විය යුතු අනෙකුත් තොරතුරු එක්රැස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 – 2026 පස් අවුරුදු සංයුක්ත සැලැස්ම 2022 වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර පිළියෙල කළ යුතු වුවද, 2022 ජූලි 04 දින වන විට එය පිළියෙල කිරීම සඳහා අධිකාරිය විසින් රු.1,641,600 ක් වැය කර තිබුණු නමුත් එදින වන විටත් සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2022-2026 පස් අවුරුදු සංයුක්ත සැලැස්ම බාහිර ආයතනයක සහය ලබා ගෙන නිවැරදි ආකෘතියකට විධිමත්ව සකස් කිරීමට යම් කාලයක් ගත වූ බව හා මේ වන විට එම කටයුතු අවසන් අධියරේ පවතින බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |